## ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය - 2011

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලන් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතයවේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 3

රු.3,710,000 ක් වටිනා ආපසු ලබා නොගත් ඇප තැන්පතු මුදලක් වර්ෂයේ ආදායමට ගැනීම ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18

අධිකාරිය සතු ප්‍රදර්ශිත මැණික් තොග 1996 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2010 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අවසන් ගිණුම්වල 2010 ජුවෙල්ස් ප්‍රදර්ශනය සඳහා උපචිත ප්‍රචාරණ වියදම් වශයෙන් රු.1,956,330 ක් දක්වා තිබුණු අතර, 2011 වර්ෂයේ ප්‍රදර්ශනයේ ප්‍රචාරණ වියදම් වශයෙන් රු.5,306,502 ක වියදමක් දරා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය රු.3,350,172 කින් අඩුවී තිබුණි.

(ආ) කුරුවිට හල්පේ මාර්ග අළුත්වැඩියා කිරීම සඳහා රු.1,400,000 ක් බාහිර පුද්ගලයන්ගෙන් අය කර මැණික් ගැරීමේ ඇප තැන්පතු මුදලට බැර කර තිබුණි. මාර්ග අළුත්වැඩියාව සඳහා මෙම මුදල පළාත් මාර්ග අමාත්‍යාංශය වෙත ගෙවා ඇතත්, අදාල තැන්පතු ගිණුමෙන් ඉවත් කර නොතිබීම නිසා එම ගිණුම රු.1,400,000 කින් ද ව්‍යාපෘති වියදම් ගිණුම එම ප්‍රමාණයෙන්ද වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ත්‍යාග අරමුදලේ ආදායම රු.5,082,600 ක් බැකෝ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ ස්ථාපිත සාප්පු හිමියන්ගෙන් ලැබිය යුතු කුලී ආදායමින් අය කරන රු.67,924 ක ජාතිය ගොඩනැගීමේ බදු මුදල ජාතිය ගොඩනැගීමේ වියදම් ගිණුමට බැර කර තිබුණි.

(ඉ) 2010 වර්ෂයේදී රු.1,355,125 ක දේශීය ප්‍රදර්ශන වියදම සඳහා වූ ඌන වෙන් කිරීම ගිණුම්වලට ගලපා නොතිබුණි.

1.2.3 නොසැසඳූ පාලන ගිණුම්

අවසන් ගිණුම් අනුව රෙදි ණය ගිණුම හා උත්සව අත්තිකාරම් ගිණුමේ පිළිවෙලන් රු.396,167 ක් රු.107,982ක් පැවතියත් උපලේඛන අනුව පිළිවෙලන් රු.327,667 ක් සහ රු.176,482 ක් වශයෙන් සඳහන්ව තිබුණි. එ අනුව වෙනස පිළිවෙලන් රු.68,500 ක් හා රු. 68,500 ක් විය.

1.2.4 පැහැදිලි නොකල වෙනස්කම්

පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| අංශය | විෂයය | ලෙජරය අනුව ශේෂය | අදාල අංශයේ තොරතුරු අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| සංඛ්‍යා ලේඛන | රන් ප්‍රමාණය නිශ්චය කිරීමේ අංශයේ ආදායම | 2,662,865 | 2,532,672 | 130,193 |
| සංඛ්‍යා ලේඛන | මැණික් පරීක්ෂණ ආදායම | 3,193,075 | 3,140,983 | 52,092 |
| රත්නපුර මැණික් හුවමාරු මධ්‍යස්ථානය | හිඟහිටි කුලී ආදායම | 2,789,500 | 3,304,500 | 515,000 |

1.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) එකතුව රු.3,407,494 ක් වූ ණයහිමි ශේෂ 5 ක් වසර 5 කට වැඩි කාලයක සිට පැවත එන අතර, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විවිධ ණයගැති ශේෂය තුළ වසර 5 ඉක්මවූ රු.33,844 ක ශේෂයක්ද වසර 3 සිට 4 දක්වා පැරණි රු.401,595 ක ශේෂයක් පැවති අතර, නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ණයගැති ශේෂය තුළ ආපසු එවූ චෙක්පත් 31 ක වටිනාකම රු.314,554 ක් පැවති අතර, එහි රු.103,552 ක් වටිනා චෙක්පත් 13 ක් වසර 3 සිට වසර 8 ක කාලයක් පැරණි වී ඇතත්, නිරවුල් කර නොතිබුණි.

(ඈ) මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයෙන් ලැබිය යුතු රු.9,786,537 ක මුදල තුළ වසර 5 ඉක්මවූ රු.6,756,089 ක ශේෂයක් වූ අතර, අවුරුදු 2 සිට අවුරුදු 5 දක්වා පැරණි ශේෂය රු.3,030,448 ක් විය.

(ඉ) ණයගැති ශේෂය තුළ තිබෙන රු.478,044 ක විශේෂ අත්තිකාරම් ශේෂයෙහි වසර 3 සිට 4 දක්වා පැරණි රු.31,550 ක ශේෂයක්ද වසර 2 සිට 3 දක්වා පැරණි රු.139,401 ක ශේෂයක්ද විය.

(ඊ) ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ ස්ථාපිත වෙළඳකුටි කුලියට දීම තුළින් 2008 සිට 2010 දක්වා කාලය සඳහා ලැබිය යුතු එකතුව රු.1,404,560 ක මුදලක් උපබදු ලබා දී ඇති පුද්ගලයන්ගෙන් අධිකාරියට අයකර ගත යුතුව තිබුණි.

(උ) රත්නපුර මැණික් හුවමාරු මධ්‍යස්ථානයේ පවතින කඩකාමර 7 කින් අයවීමට ඇති මුදල රු.1,542,500 ක් විය.

1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව කටයුතු නොකල අවස්ථා | |
| (i) 8.9.1 (ආ) ඡේදය අනුව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීම | (අ) පැරඩයිස්වත්ත (ගුවන් විදුලි සංස්ථා කොටස) භූමියේ පතල් කැණීම් කටයුතු හේතුවෙන් කුඹුරු ඉඩම්වලට රොන්මඩ ගලායාම සම්බන්ධ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත රු.500,000 ක් ලබා දී ඇතත්, ගිවිසුමකට එළඹ නොතිබුණි. 2012 ජුනි 14 දින සභාපතිවරයා විසින් එවන ලද පිළිතුරු අනුව අදාල ප්‍රතිසංස්කරණ කාර්යය සඳහා ගොවි සංවිධාන සමඟ ගිවිසුමක් අත්සන් කර ඇති බැවින් අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹීමට නොහැකිබව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව දන්වා ඇතිබව සඳහන් කර තිබුණි. |
| | (ආ) ඉහත (අ) හි සඳහන් ඉඩමෙහි පතල් වලවල් වැසීම, රොන්මඩ පෙරණ පද්ධති සැකසීම හා ඉඩම වටා ඇති නිවාසවලට යන ගුරු පාර සැකසීම සඳහා ඇස්තමේන්තු වියදම රු.1,408,000 ක් වූ අතර, මෙම කාර්යය ඉටු කිරීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සමඟ ගිවිසුමකට එළඹ නොතිබුණි. |

| | |
|---|---|
| (ii) 5.4.4 ජේදය අනුව අත්තිකාරම් මුදල් ගෙවීමේදී 20% ක උපරමයක් ගෙවීම | පරිගණක ලිපි ලේඛණ අනුමත කිරීමේ පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය වෙත 2011 අප්‍රේල් 4 දින අත්තිකාරම් ලෙස 50% ක එනම්, රු.277,500 ක් ගෙවා තිබුණි. |
| (iii) 4.3 ජේදය | අධිකාරයේ බිම් මහලේ සිට දෙවන මහල දක්වා වැසිකිළි පද්ධතිය හා ජල කාන්දුව පිළිසකර කර අළුත්වැඩියා කිරීමේදී මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. 2011 ජුනි 14 දින සභාපති විසින් එවන ලද පිළිතුරු අනුව මෙය කඩිනමින් පිළිසකර කළයුතු බැවින් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල නොකර ලියාපදිංචි ගොඩනැගිල ඉදිකර්ම් ආයතන කිහිපයකින් මිල ගණන් කැඳවා සිදුකල බව උන්වා තිබුණි. |
| (ආ) 2000 අගෝස්තු 31 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මැණික් ගැරීමේ අයිතිය පිළිබඳ ප්‍රතිපත්ති හා ක්‍රියාපටිපාටි ඇතුලත් වාර්තාව | |
| 6.5 ජේදය | රජය සතු ඉඩම්වල මුළු වෙන්දේසි ආදායම අධිකාරය සතු වන බව දැක්වෙතත්, හසලක වැල්ගහවාඩිය රජයේ ඉඩම සඳහා මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත රු.872,606 ක මුදලක් ගෙවීමට වෙන් කර තිබුණි. මෙම වෙන්දේසි ඉඩම් වල දැඩිලෙස අනවසර ගැරීම් සිදු වන බැවින් වෙන්දේසි කිරීම සඳහා නිදහස් කර දෙන මෙන් අවස්ථා ගණනාවකදී ඉල්ලීම් ඉදිරිපත් කර ඇතත් එම ආයතනය විසින් විවිධ කොන්දේසි ඉදිරිපත් කර ඊට අවස්ථාව ලබාදීම මගහැර තිබුණි. එබැවින් |

| | |
|---|---|
| | අනවසර ගැරීම් නිසා සිදුවන පරිසර හානි අවම කර ගැනීමටත්, රජයට හිමිවිය යුතු ආදායමක් ලබාගැනීමත් අරමුණු කොට එම ආයතන වෙත යම් ප්‍රතිශතයක් ගෙවීමට එකඟවී ඉඩම් නිදහස් කර වෙන්දේසි සිදුකොට ඇති බව සභාපතිවරයා විසින් දන්වා එවා තිබුණි. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| 5 ජේදය | 2009 සිට 2013 වර්ෂය දක්වා වූ සංයුක්ත සැලැස්මට තථ්‍ය හා ළඟා කරගත හැකි අරමුණු ඇතුළත් විය යුතු අතර, අයවැය ලේඛණය මගින් එම අරමුණ ළඟා කර ගැනීමට ප්‍රතිපාදන සැලසිය යුතු වේ. එහෙත් ආයතනයෙහි අයවැය ලේඛණයෙන් ක්‍රියාකාර සැලැස්මෙහි අරමුණු ආවරණය නොවන අවස්ථා දක්නට ලැබුණු අතර, ඉන් කීපයක් පහත දැක්වේ. ඒ අනුව සංයුක්ත සැලැස්මෙහි අරමුණු හා පරමාර්ථ තථ්‍ය වශයෙන් ළඟා කරගත හැකි මට්ටමෙහි ඒවා නොවන බව අනාවරණය විය.<br>උදා :-<br>i. මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ජාතික සැලැස්මක් ඇති කිරීම.<br>ii. සංගහණයක් තුලින් එහි ප්‍රතිඵල වැඩි දියුණු කිරීම.<br>iii. නීති විරෝධී මැණික් ගැරීම් වැටලීම සඳහා විශේෂ බලකායක් ඇති කිරීම.<br>iv. මැණික් පරීක්ෂා කර නිකුත් කරන සහතික වල ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීම සඳහා Spectometer මිලදී ගැනීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ගිණුම් අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය බදුවලට පෙර රු.8,177,976 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදුවලට පෙර ශුද්ධ පාඩුව රු.32,966,486 ක් විය. ඉඩම් වෙන්දේසි ආදායම රු.11,331,900 කින් වැඩිවීම, ආයතනික වියදම රු.11,374,973 කින් සහ ප්‍රවර්ධන වියදම රු.23,577,186 කින් අඩුවීම අතිරික්තයක් ලැබීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරකට අදාල අධිකාරියේ ලාභදායීත්වය පහත පරිදි විය.

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ආදායම | 215,730,616 | 258,179,893 | 220,671,589 | 228,963,191 | 249,179,325 |
| වියදම | 232,277,006 | 228,772,163 | 233,705,664 | 261,929,677 | 241,001,350 |
| බදුවලට පෙර ලාභය / (පාඩුව) | (16,546,390) | 29,407,730 | (13,034,075) | (32,966,486) | 8,177,975 |

මේ අනුව ඉකුත් වර්ෂ ගණනාවක සිට අධිකාරියේ ලාභදායිත්වය සැලකිය යුතු උච්චාවචනයන්ට භාජනය වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) මැණික් ඉඩම් වෙන්දේසි කිරීම

2011 වර්ෂය සඳහා වූ අයවැය ලේඛණය අනුව රජයේ සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම සතු ඉඩම් වෙන්දේසි කිරීම තුළින් රු.65,500,000 ක ආදායමක් අපේක්ෂා කර තිබූ නමුත් අධිකාරිය විසින් උපයාගෙන ඇති ආදායම රු.28,837,872 ක් විය. ඒ අනුව, අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීම 44% ක තරම් අඩු මට්ටමක විය.

(ආ) මැණික් හා ස්වර්ණාභරණ අපනයන

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) අධිකාරිය මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයෙහි විදේශ ප්‍රවර්ධනය වෙනුවෙන් විදේශ ප්‍රදර්ශන සඳහා සහභාගිවන අතර, ඒ වෙනුවෙන්ද ශ්‍රී ලංකා මැණික් හා ස්වර්ණාභරණ සංගමය හරහා විදේශ ප්‍රචාරණය වෙනුවෙන්ද වාර්ෂිකව මුදල් වැය කරයි. අධිකාරිය සහතික කර විකිණීම සඳහා යවනු ලබන රු.26,601,128ක් වටිනා මැණික් හා ස්වර්ණාභරණ සියල්ලම නොවිකිණී ආපසු එවූ අවස්ථා 7 ක් නියැදි පරීක්ෂාවේදී හෙළි විය.

(ii) සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 4 ක ප්‍රවර්ධන වියදම් හා එහි ඇතුලත් විදේශ ප්‍රදර්ශන සඳහා දරා ඇති වියදම පහත පරිදි වේ.

| වර්ෂය | ප්‍රවර්ධන වියදම | විදේශ ප්‍රදර්ශන වියදම | ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | |
| 2007 | 38.130 | 15.705 | 41.18% |
| 2008 | 34.776 | 14.366 | 41.31% |
| 2009 | 33.264 | 13.385 | 40.23% |
| 2010 | 49.028 | 1.406 | 2.86% |
| 2011 | 25.451 | 8.355 | 32.82% |

(iii) අපනයනය කරනු ලබන තොග සියල්ලම ආපසු එවීමට හේතු කවරේද යන්න හා විදේශ ප්‍රවර්ධනය වෙනුවෙන් වාර්ෂිකව වැය කරනු ලබන මුදල් වලින් නිසි ඵල ලැබේද යන්න පිළිබඳ විගණනයට තහවුරු නොවීය.

(ඇ) රන් ප්‍රමාණය නිශ්චය කිරීමේ අංශය

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2011 වර්ෂයේ මැණික් පර්යේෂණ ආදායම, අවසන් ගිණුම් අනුව රු.3,295,575 ක් වූ අතර, එම කාලය තුළ කාර්ය මණ්ඩල පිරිවැය හා උපකරණ ක්ෂය වෙනවෙන් පිළිවෙලින් රු.4,353,322 ක් හා රු.787,369 ක් වශයෙන් එකතුව රු. 5,140,691ක් විය. ඒ අනුව, 2011 මැණික් පර්යේෂණ ආදායම ඉක්ම වූ වියදම රු.1,845,116 ක් හෙවත් 56% ක් විය.

(ii) 2011 වර්ෂයේ ස්වර්ණාභරණ පරීක්ෂණ ආදායම රු.1,523,158 ක් වූ අතර, එකී කාලය තුළ කාර්ය මණ්ඩල පිරිවැය හා ක්ෂය වෙනුවෙන් පිළිවෙලින් රු.3,491,797 ක් හා රු.1,224,403 ක් විය. ඒ අනුව, ආදායම ඉක්මවූ වියදම රු.3,193,042 ක් හෙවත් 209% ක් විය.

2010 හා 2011 වර්ෂවල සහතික පත්‍ර නිකුත් කිරීමේ ප්‍රගතිය ආසන්න වශයෙන් 3% ක අඩුවීමක් නිරීක්ෂණය විය.

(ඈ) ගෙවුඩ අපනයන

ගෙවුඩ අපනයන බිංදුව දක්වා අඩු කිරීම ආයතනයේ පරමාර්ථය වුවද, 2009 වර්ෂය සමඟ සැසඳීමේදී 2010 වර්ෂයේ සහ 2011 වර්ෂවලදී ගෙවුඩ අපනයනය පිළිවෙලින් 26.74% කින් හා 36.21% කින් වැඩි වී තිබුණි. එය අඩු කිරීම සඳහා අගය එකතු කළ අපනයන කෙරෙහි වැඩි උනන්දුවක් ඇතිකරමට කටයුතු කරමින් පවතින බව සභාපති දන්වා ඇත.

(ඉ) යන්ත්‍ර යොදා පතල් කැපීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් පතල් කැපීමට අවසරය දී ඇති ඉඩ ප්‍රමාණය ඉක්මවා අධිකාරිය විසින් පතල් කැපීමට අවසරය ලබා දී තිබූ අවස්ථා 5 ක් පහත පරිදි නියැදි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව නිර්දේශ ලබාදෙනුයේ යම් සීමාවක ඇති ඛනිජ ඉවත් කර ගැනීමට නිශ්චිත වපසරියකි. ඉන්පසු එළඹෙන වර්ෂවලද මෙලෙස අවසර දෙනු ලබන අතර එම ඉඩදී ඇති ප්‍රමාණය මුල් ප්‍රමාණයම නොවේ. ඒ අනුව අධිකාරිය පතල් කැපීමට අවසර දුන් වර්ෂ කිහිපයක ඛනිජ අයිතියේ එකතුවක් බව සභාපතිවරයා විසින් එවන ලද පිළිතුරුවල දක්වා තිබුණි.

| ලිපිගොනු අංකය | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම විසින් අවසර දී ඇති ප්‍රමාණය | අධිකාරිය විසින් ඉඩදී ඇති ප්‍රමාණය |
|---|---|---|
| | | වර්ග අඩි |
| 17/2/1/3/71769 | පර්චස් 15 (වර්ග අඩි 4005) | 9,888 |
| 17/2/1/1/3/65898 | පර්චස් 1 (වර්ග අඩි 267) | 1,000 |

| | | |
|---|---|---|
| 17/2/1/1/3/66971 | පර්චස් 1 (වර්ග අඩි 267) | 15,000 |
| 17/2/1/1/3/63245 | පර්චස් 20 (වර්ග අඩි 5340) | 12,213 |
| 17/2/1/3/72500 | පර්චස් 20 තුළ (වර්ග අඩි 267) | 16,408 |

(ii) 5/41/P/59380 දරන බලපත්‍ර නිකුත් කිරීමේ ලිපිගොනුව පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

- 2007 සැප්තැම්බර් 14 දින ක්‍රියාත්මක නිලධාරි විසින් සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී වර්ග අඩි 12,000 ප්‍රමාණයේ පතලක් කැපීම හා ඇළ මාර්ගයට හානි සිදු කිරීම පිළිබඳව වාර්තා වී තිබූ අතර, 121(3) චක්‍රලේඛය අනුව රු.660,000 ක සමථ ගාස්තුවක් හා පතල වැස්සවීම හෝ අමතර ඇප අය කිරීම කළයුතු වුවත්, රු.10,000 ක සමථ ගාස්තුවක් පමණක් අය කර තිබුණි.

(iii) සමථ ගාස්තු තීරණය කිරීමේදී 1993 අංක 50 දරණ ජාතක මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 52 වගන්තියෙහි සීමාවන් පනවා තිබුණද, නියෝග නිකුත් කිරීමේ හා රීති සෑදීමේ බලය අධිකාරිය සතුවන බැවින්, වසර 17 ක් පැරණි මෙම රීති මත පදනම් නොවී වර්තමානයේ කර්මාන්තයේ තත්ත්වය සැලකිල්ලට ගනිමින් එහි දියුණුව උදෙසා අධිකාරිය කටයුතු කළ යුතු බව, පතල් කැනීම් සම්බන්ධව කරන ලද නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

(iv) බලපත්‍රයේ සඳහන් කොන්දේසි කඩ කිරීම, නීති විරෝධී ලෙස පතල් කැපීම යනාදිය සම්බන්ධයෙන් වර්ෂ 5 කට වඩා පැරණි අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛයක් පදනම් කරගෙන සමථයකට පත් කිරීම සිදු කරනු ලබන අතර, එහිදී සමථයකට පත් කිරීමේ කොන්දේසිවල ලිහිල් භාවය හේතුවෙන් නැවත නැවතත් එකී වැරදි සිදු කරන බවත්, ඒ මත විශාල පරිසර හානි සිදු වී ඇති බවත් නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට දැනට විශේෂ ඒකකයක් පිහිටුවා ඇතිබව සභාපතිවරයා පිළිතුරු ලෙස දැනුම් දී ඇත.

(ඊ) විදේශ වෙළඳ ප්‍රදර්ශන

(i) 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත 14 (1) ඇ වගන්තිය අනුව ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත හෝ මැණික් සහ ස්වර්ණාභරණ සඳහා වූ වෙළඳපොල ප්‍රයෝජනයට ගැනීම සහ මැණික් සහ ස්වර්ණාභරණ සඳහා ලෝක වෙළඳපොළට ඉල්ලුම් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළ යුතු වුවත්, අධිකාරිය විසින් 2009, 2010, 2011 වර්ෂ තුළදී විදේශ වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම පහත පරිදි වූ අතර, එය රටවල් කිහිපයකට පමණක් සීමා වී තිබීමෙන් මෙම අරමුණ ඉටුවී නොතිබුණ බව නිරීක්ෂණය කෙරේ.

| රට | පවත්වන ලද ප්‍රදර්ශන සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | 2011 | 2010 | 2009 |
| චීනය | 5 | 4 | 3 |
| සිංගප්පූරුව | 1 | 1 | 1 |
| ඉන්දියාව | - | - | 1 |
| ජපානය | - | - | 1 |
| ඇමරිකාව | - | - | 1 |
| | 6 | 5 | 7 |

(ii) ක්‍රියාකාරී සැලැස්ම අනුව, සමාලෝචිත වර්ෂයේදී විදේශීය ප්‍රදර්ශන 12 ක් පැවැත්වීමට සැලසුම් කර තිබූ නමුත් ප්‍රදර්ශන 6 ක් පමණක් පවත්වා තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී විදේශ ප්‍රදර්ශන 6 ක් පැවැත්වීම සඳහා රු.29,576,767 ක වියදමක් දරා තිබුණ අතර, රු.20,204,861 ක් පමණක් ප්‍රදර්ශන සඳහා සහභාගීවූවන්ගෙන් අයකරගෙන තිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තත්ත්ව රසායනාගාරයක් පිහිටුවීම සඳහා 2001 වසරේ සිට 2005 වසර දක්වා අපනයන ආදායමින් අයකරගත් රු.99,545,573 ක මුදලින් අරමුදලක් පිහිටුවා තිබණි. මෙම අරමුදලින් රු.7,046,995 ක මුදලක් තත්ත්ව සහතික නිකුත් කිරීමේ පහසුකම් සැපයීමට එකඟ වූ ඇමරිකානු මැණික් වෙළඳ සමාගමකට ගෙවා තිබුණද,

ඉන් කිසිදු ප්‍රයෝජනයක් සිදු වී නොතිබුණි. රසායනාගාරය ඉදි කිරීම සඳහා 2009 අප්‍රේල් වන තෙක්ම අවශ්‍ය පියවර ගෙන නොතිබූ අතර, 2009 අප්‍රේල් මාසයේදී එම අරමුදලේ රු.92,498,578 ක ඉතිරි මුදල අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත පෞද්ගලික ආයතනයකට එම කාර්යය ඉටු කිරීම සඳහා ලබා දී තිබුණි. 2011 මාර්තු 31 දිනට එම අරමුදලේ ශේෂය රු.102,970,217 ක් වූ අතර, එම මුදලින් 2010 හා 2011 වර්ෂවලදී විගණන ගාස්තු හා විවිධ වියදම් දැරීම සඳහා රු.621,609 ක් වැය දරා තිබුණි. රසායනාගාරය පිහිටුවීම සඳහා කිසිදු කටයුත්තක් සිදු කර නොතිබූ අතර, 2011 මාර්තු 31 දිනට විගණිත ගිණුම් වාර්තාවක්ද විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) මැණික් ගැරීමේ සුභ සාධක අරමුදල

පතල් කර්මාන්තයේ යෙදෙන සියළු දෙනාට බදු සහනයක් ලබා දීම වශයෙන් නීත්‍යානුකූලව බලපත්‍රයක් ලබා ගත් අයෙකු විසින් එමගින් ලැබෙන මැණික් අධිකාරියේ බලපත්‍රයක් යටතේ වෙන්දේසි කිරීම හෝ විකිණිය යුතුය. එමගින් ලැබෙන මුළු ආදායමින් 1% ක වටිනාකමින් යුතු මුදලක් පතල් කර්මාන්තයේ යෙදී සිටින සැමගේ යහපත උදෙසා පිහිටුවා ඇති අධිකාරියේ අරමුදලට බැර කළ යුතු බව දැක්වේ. ඒ අනුව, 1999 සිට 2008 වසර දක්වා එසේ එකතු කර ගත් මුදල අධිකාරියේ මැණික් ගැරීම් සුභ සාධක අරමුදලට බැර කර තිබූ අතර, 2011 දෙසැම්බර් 31 දිනට අරමුදලේ ශේෂය රු.27,356,498 ක්ව පැවතුණි. 2008 සිට මෙම අරමුදලට බැර කිරීම අත්හිටුවා තිබූ අතර, මේ දක්වා පතල් කර්මාන්තයේ නියැලී සිටින්නන්ගේ සුභ සාධනය වෙනුවෙන් එම අරමුදල ක්‍රියාත්මක කළ බවක් විගණනයට නිරීක්ෂණය නොවීය.

(ඇ) ස්වර්ණාභරණ සංවර්ධන අරමුදල

ස්වර්ණාභරණ කර්මාන්තයේ නියැලී සිටින්නන්ගේ සංවර්ධනය උදෙසා ස්වර්ණාභරණ වෙළඳාමේ නියුක්තිකයන්ගෙන් 2008 වසරේ සිට අයකරගත් මුදලින් ස්වර්ණාභරණ සංවර්ධන අරමුදලක් පිහිටුවා තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ රු.17,420,083 ක මුදලක් බැරට තිබුණු අතර, කර්මාන්තයේ සංවර්ධනය උදෙසා සමාලෝචිත වර්ෂයේදී මෙම අරමුදල යොදා ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(ඈ) වාහන උපයෝජනය

අධිකාරිය විසින් එක් වාහනයකට රු. 26,000 ක් බැගින් වාහන 7 ක් සඳහා GPRS/GPS Vehicle Tracking System සවිකිරීම සිදුකර තිබූ අතර එය ක්‍රියාත්මක කිරීමේදී ටැංකිවල විවිධ ස්වභාවය අනුව ක්‍රියාත්මක කළ නොහැකි

හෙයින් පද්ධතිය ගලවා ඉවත්කර තිබුණි. තාක්ෂණික කමිටුව විසින් ප්‍රායෝගික තත්වයන් පිළිබඳව අවධානය යොමුකිරීමකින් තොරව තීරණ ගැනීම නිසා මෙවැනි තත්වයකට මුහුණපෑමට සිදු වූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ස්ථාවර වත්කම් යටතේ කෙරීගෙනයන වැඩ සම්බන්ධයෙන් 2001 සිට 2005 දක්වා කාලය තුළ මැණික පුරයේ ඉදිකිරීම් කටයුතු සඳහා රු.1,500,441 ක් වැය දරා තිබුණි. මේ සම්බන්ධයෙන් කසියම් වූ ඵලදායී වැඩි දියුණු කිරීමේ කාර්යයක් පසුගිය වර්ෂ 7 තුළදීම සිදු කර නොතිබූ අතර, දැනට මෙම මැණික් පුරය ඉදිකිරීමේ කටයුතු අත්හැර දමා තිබුණි.

(ආ) රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයෙහි මැණික් ගල් පරීක්ෂාව සඳහා පවතින රසායනාගාරයෙහි පහත සඳහන් උපකරණ දිගු කාලයක සිට ක්‍රියාවිරහිතව පවතී.

(i) Ultraviolet machine
(ii) Spectroscope machine
(iii) Fribolic machine

(ඇ) සම්පත් බැංකුවේ අන්තර්ජාලය හරහා සිදුකෙරෙන ගෙවීම් සඳහා පවත්වාගෙන යන ගිණුමේ රු.37,119.25 ක ශේෂයක් 2007 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

3.4 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 ජුවෙල්ස් ප්‍රදර්ශනය සඳහා දරන ලද ප්‍රචාරණ වියදම රු.5,495,823 ක් වූ අතර, එය මුළු ප්‍රදර්ශන වියදමෙන් 20% කට ආසන්න අගයක් විය. ටිකට්පත් අලෙවියෙන, වෙළඳ කුටිවලින් හා භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ දායකත්වයක්ද ඇතුළුව රු.5,710,333 ක මුදලක් මෙම ප්‍රදර්ශනයෙන් ලැබී තිබූ අතර, ශුද්ධ වියදම රු.22,086,972 ක් විය. අධිකාරියේ ක්‍රියාකාරිත්වය මූල්‍ය තත්ත්වය හා පවතින සම්පත් පිළිබඳව සැලකීමේදී මෙවැනි විශාල වියදමක් දරා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය උදෙසා කරන ලද මෙම ප්‍රදර්ශනයෙන් දේශීය හා විදේශීය පුද්ගලයින්ගේ සහභාගිත්වය අපේක්ෂිත ප්‍රමාණයෙන් 26% ක පමණ පහළ අගයක් විය.

(ආ) ප්‍රාදේශීය කාර්යාල විසින් බැංකු ගිණුමවල පවත්වාගත යුතු උපරිම බැංකු ශේෂයන් ලෙස නියම කර ඇති මුදලට වඩා වැඩියෙන් රු.4,862,759 ක අතිරික්ත ශේෂයක් පවත්වා ගෙන ගොස් තිබුණි.

3.5 හඳුනා ගන්නා ලද පාඩු
--------------------------

බෙලිදෙණිය ගොඩනැගිල්ලේ ජල බිල්පත් නියමිත දිනට නොගෙවීම නිසා ජල සම්බන්ධතාවය විසන්ධි කිරීම නැවත ලබා ගැනීම වෙනුවෙන් රු.11,760 ක්ද, කොළඹ මහ නගර සභාව වෙත 2008, 2009 වසරේ වරිපනම් මුදල් ගෙවීමේදී වරෙන්තු ගාස්තු ලෙස රු.2,440 ක්ද ගෙවා තිබුණි.

3.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් අධිකාරියේ සම්පත්
-----------------------------------------------------------------

අංක PED/12 දරන හා 2003 ජූනි 02 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛයේ 3.8.9 ඡේදයට පටහැනිව අධිකාරිය විසින් අනියම් හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් නිලධාරීන් තුන්දෙනෙක් සඳහා රු.592,958 ක් ද වාහන 2 ක් වෙනුවෙන් රු.337,069 ක වියදමක්ද අමාත්‍යාංශය වෙනුවෙන් දරා තිබුණි.

3.7 කාර්ය මණ්ඩල පරිපාලනය
------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අධිකාරිය සඳහා අනුමත සේවක සංඛ්‍යාව ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා බඳවාගෙන තිබූ සංඛ්‍යාව හා සැසඳීමේදී පුරප්පාඩු පවතින බව අනාවරණය විය.

| වර්ගය | 2011 දෙසැම්බර් 31 දිනට | | |
|---|---|---|---|
| | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
| මාණ්ඩලික | 51 | 36 | 15 |
| මාණ්ඩලික නොවන | 169 | 91 | 78 |
| සුළු සේවක | 52 | 40 | 12 |
| කොන්ත්‍රාත් | - | 60 | - |
| අනියම් | - | 11 | - |
| | 272 | 238 | 105 |

(ආ) 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි 9.3.1 (vi) හා 9.10 ඡේදය අනුව, වැඩ බැලීමේ තනතුරක උපරිම කාලය මාස 3 ක් විය යුතුය. නමුත්, ආයතනයෙහි දීර්ඝ කාලීනව පවතින වැඩ බැලීමේ / වැඩ ආවරණය කිරීමේ තනතුරු, පිරවීමට හෝ අහෝසි කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ මාණ්ඩලික තනතුරුවල වැඩ බැලීමේ / වැඩ ආවරණය කිරීම වෙනුවෙන් නිලධාරීන් 07 දෙනෙකුට 2011 වර්ෂය තුළදී රු.422,305 ක් ගෙවා තිබුණි.

(ඈ) 2006 නොවැම්බර් 09 දිනැති ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අංක NSCC/2/43/CB1 ලිපිය අනුව නව වැටුප් ක්‍රමයේ ප්‍රතිලාභ සේවකයන්ට ලබා දීම සඳහා පවතින බඳවා ගැනීමේ උසස් කිරීමේ පරිපාටිය සංශෝධනය කළ යුතු වවද, අධිකාරිය විසින් බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කර අනුමත කර නොතිබුණි.

(ඉ) අනුමත තනතරු වු නියෝජ්‍ය ජොෂ්ඨ තක්සේරුකරු / රත්න විද්‍යාඥ (ii) යන තනතුරු 2 ම අධිකාරිය ආරම්භයේ සිටම පුරප්පාඩුව පැවතුණි. තක්සේරුකරු / රත්න විද්‍යාඥ (ගෙවුඩ) තනතුරු 2 ක් අනුමත වී තිබුණද, 2006 ජූනි 13 දින සිට එම තනතුරුද පුරප්පාඩුව පැවතුණි.

(ඊ) අධිකාරියේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2011 පෙබරවාරි 14 දින සිට පුරප්පාඩුව පැවති අතර, ඒ සඳහා 2012 අප්‍රේල් වනතෙක්ම බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාත්මක නොවූ කාර්යයන් පහත දැක්වේ.

(i) මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම.

(ii) මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයෙහි සංගණනයක් කිරීම.
2006 ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ මෙම කාර්යය ඉටු නොවීම මත 2009-2013 සංයුක්ත සැලැස්මටද, 2011 ක්‍රියාකාරී සැලැස්මටද ඇතුළත්

කර තිබුණු අතර, 2011 දෙසැම්බර් 31 වන විට දිස්ත්‍රික්ක 2 ක පමණ සංගණන කටයුතු අවසන් කර තිබුණි.

(iii) ජාතික කෞතුකාගාරයෙහි මැණික් මැදිරියක් පිහිටුවීම.

(iv) මැණික් පරීක්ෂාකර නිකුත් කරන සහතිකයේ තත්ත්වය උසස් කිරීම සඳහා FTIR උපකරණය ලබා ගැනීම.

(v) ස්වර්ණාභරණ නිෂ්පාදනවල නීත්‍යානුකූලව වලංගුවන මාත්තු බැලීම් හා මුද්‍රා තැබීම් ගාල්ල හා නුවර ශාඛා කාර්යාලවල පිහිටුවීම.

(vi) කාර්ය මණ්ඩල පුහුණුව යටතේ පරිගණක දත්ත ගොනුවක් ඇති කිරීම. ගොනුවක් 2012 ඇති කිරීමට මූලික කටයුතු ආරම්භ කොට ඇත බව සභාපතිවරයා විසින් එවන ලද පිළිතුරුවල දක්වා තිබුණි.

(ආ) සංයුක්ත සැලැස්මට ළඟා කරගත හැකි අරමුණු ඇතුළත් විය යුතු අතර, අයවැය ලේඛණය මගින් එම අරමුණු ළඟා කර ගැනීමට ප්‍රතිපාදන සැලසිය යුතු වේ. එහෙත් ආයතනයෙහි අයවැය ලේඛණයෙන් ක්‍රියාකාර සැලැස්මෙහි අරමුණු ආවරණය නොවන අවස්ථා දක්නට ලැබුණු අතර, ඒ අනුව ආයතනයේ සංයුක්ත සැලැස්මෙහි අරමුණු හා පරමාර්ථ ළඟා කරගත හැකි මට්ටමෙහි ඒවා නොවන බව අනාවරණය විය.

4.2 අභ්‍යන්තර විගණනය

----------------------

2011 පෙබරවාරි 14 දින සිට ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවති අතර, ඒ සඳහා ගණකාධිකාරීවරයෙකු වැඩ බැලීම සඳහා පත් කර තිබුණි. අනුමත කාර්ය මණ්ඩලයට සහායක අභ්‍යන්තර විගණන නිලධාරීන් 2 ක පුරප්පාඩු පවතින අතර, ඒ සඳහා අනියම් නිලධාරීන් දෙදෙනෙකු අනුයුක්ත කර තිබුණි.

2012 ජුනි 14 දින සභාපතිවරයා විසින් එවන ලද පිළිතුරු අනුව ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර සඳහා ගණකාධිකාරීවරයෙකු පත්කර ඇති අතර අනෙකුත් පුරප්පාඩු බඳවා ගැනීමේ පරිපාටිය අනුමත වූ වහාම පිරවීමට කටයුතු කරනු ඇත. දැනට විගණක සහයකයෙකු ලෙස කොන්ත්‍රාත් සේවකයෙකු අනයුක්ත කර ඇති බවත් දක්වා තිබුණි.

4.3 ප්‍රසම්පාදන සැලැස්ම

අධිකාර්ය විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.4 අයවැය ලේඛනමය පාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රන් ප්‍රමාණය නිශ්චය කිරීමේ අංශය සඳහා 2011 වර්ෂයේ රු. මිලියන 6.57 ක ප්‍රතිපාදනයක් ලබා දී තිබුණු නමුත්, මොරටුව විශ්ව විද්‍යාලය සමඟ කාර්යය කිරීමට රු. මිලියන 6.32 ක වෙන්කර තිබූ නමුත් එම කාර්යය අත්හැර දමා තිබුණි.

(ආ) පතල් වැසීම වෙනුවෙන් 2011 වර්ෂය සඳහා රු. මිලියන 15 ක් වෙන් කර තිබුණු අතර, දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති 3 ක් වෙනුවෙන් රු.2,624,920 ක් මුදලක් වැය කර තිබුණි. ඒ අනුව මුළු ප්‍රතිපාදනයෙන් 82% කට වැඩි ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

(ඇ) පරිසර හිතකාමී මැණික් කැපීම් වැඩි දියුණු කිරීම් වෙනුවෙන් වැඩබිම් 5 ක් වෙනුවෙන් රු.මිලියන 7 ක් ඇස්තමේන්තු කර ඇතත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) විදේශ ප්‍රදර්ශන සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ප්‍රදර්ශන සඳහා සහභාගීවන්නන්ගෙන් ලැබෙන ආදායම සැලකිල්ලට නොගෙන ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි.

(ඉ) දියමන්ති කැපීම් කර්මාන්තය දියුණු කිරීම උදෙසා පුහුණු පාඨමාලාවක් පැවැත්වීම වෙනුවෙන්, පුහුණුවන්නන්ට ගෙවීම සඳහා රු. මිලියන 6.75 ක් වෙන් කර තිබුණු අතර, රු.7,500 ක් පමණක් වැය කර තිබුණි.

(ඊ) අයවැයගත දත්ත කෙරේ ළඟා වීම 25% සිට 840% ක අතර අගයක් ගැනුණි.

ඉහත නිරීක්ෂණ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

4.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2009 හා 2010 වර්ෂවල වාර්ෂික වාර්තා 2012 වර්ෂයේ අප්‍රේල් වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 4.6 විශේෂ විමර්ශන කටයුතු සිදුකිරීම

අධිකාරිය තුල විශේෂ විමර්ෂන ඒකකයක් නොමැති අතර අධිකාරිය වෙත ලැබෙන පෙත්සම් සම්බන්ධයෙන් ක්‍රියාත්මක නිලධාරි හා කළමනාකරු (නීති) විසින් ඒ පිළිබඳව කටයුතු කරනු ලබයි. අධිකාරියෙන් ලබාගත් තොරතුරු අනුව ඇහැළියගොඩ 1,2 කලාපවලට පමණක් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 22 ක් වු අතර ඉන් 19 ක පරීක්ෂණ කටයුතු නිම කර ඇතිබවත් සඳහන් කර තිබුණි. රත්නපුර, නාඋල, මාතර සහ කොළඹ කාර්යාල වෙත ලද පැමිණිලි සම්බන්ධව වාර්තා කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කල යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) මිලදී ගැනීම්
(ඇ) අත්තිකාරම් ගෙවීම
(ඈ) රන් ප්‍රමාණය නිශ්චය කිරීමේ හා තක්සේරු අංශවල මෙහෙයුම්
(ඉ) බැංකු සැසඳීම් පිළියෙල කිරීම
(ඊ) බලපත්‍ර නිකුත් කිරීම